ගලේවෙල ප්‍රාදේශීය සභාව
මාතලේ දිස්ත්‍රික්කය
-------------------------

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 13 දින ද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 23 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2. තත්ත්වාගණනය කළ මතය
---------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ගලේවෙල ප්‍රදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්වාගණනය කළ මතය සඳහා පදනම
--------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

| | ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා දෙකකදී සභාවේ ගොඩනැගිලි සංවර්ධන කටයුතු සඳහා දරන ලද රු.590,000 ක වටිනාකමක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |
| (ii) | ස්ථාවර වත්කම්වල එකතුව හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමේ ශේෂය සමාන විය යුතු වුවත් රු.1,166,909 ක වෙනසක් තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |
| (iii) | දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගත් ණය සඳහා ඉදිරි වර්ෂ වෙනුවෙන් ගෙවිය යුතු රු.6,105,856 ක ණය පොලී මුදල වගකීම් වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |

(ආ) නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.380,517,187 ක් වූ ගිණුම් විෂයන් 07 කට අදාළ ශේෂයන් හා ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර රු.109,215,357 ක අසමානතාවයන් විය. | ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කළ යුතු වේ. | මෙම අසමානතා දිර්ඝ කාලයක සිට පැවතෙන බැවින් පසුගිය වර්ෂවල මූල්‍ය ප්‍රකාශන එකින් එක පරීක්ෂා කර බලා නිරවුල් කිරීමට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම

1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 217 | සභාව සතු සියලු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව පී.එස් 46 ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලි ලේඛනයක් යාවත්කාලීනව නඩත්තු කර නොතිබුණි. | ලේඛන යාවත්කාලීන කළ යුතු වේ. | සභාව සතු සියලුම ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර පී.එස්.46 ලේඛනය යාවත්කාලීන කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) | 104(1)(අ) | 2016 හා 2017 වර්ෂවල අනතුරට ලක්වී තිබුණු යන්ත්‍රෝපකරණ 02 ක් සම්බන්ධයෙන් වගකිවයුත්තන් නිශ්චය කිරීමට පරීක්ෂණ කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 104(1) ප්‍රකාරව වගකිව යුතු පුද්ගලයන් නිශ්චය කළ යුතු වේ. | ඉදිරියේදී මෙම වාහන අලුත්වැඩියා කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |
| (ii) | 570(අ) | වටිනාකම රු.1,712,721 ක් වූ වර්ෂ 02 ක් ඉක්මවූ තැන්පතු 146 ක් ආදායමට ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි 570(අ) ප්‍රකාරව ඉකුත් තැන්පතු ආදායමට බැර කළ යුතු වේ. | මෙම ලේඛන පරික්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | 2015 පෙබරවාරි 02 දිනැති අංක 1900/8 | ප්‍රාදේශීය සභාවල මන්ත්‍රීවරුන්ට රු.1,000 ක | අදාළ රීතිවලට අනුව දුරකථන | මහා සභා තීරණයක් මත මෙම ගෙවීම් සිදුකර ඇති |

| | | | | |
|---|---|---|---|---|
| | දරන අතිවිශේෂ ගැසට් පත්‍රය | දුරකථන දීමනාවක් පමණක් ගෙවිය හැකි වුවත් ප්‍රාදේශීය සභාවේ උපසභාපතිවරයා වෙත 2018 දෙසැම්බර් 13 දිනැති මහ සභා තීරණය මඟින් මාසිකව රු.5,000 ක උපරිමයකට යටත්ව දුරකථන දීමනා ගෙවා තිබුණි. | දීමනා ගෙවිය යුතු වේ. | බව දන්වා ඇත. |
| (ඈ) | 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 වගන්තිය | සභාව සතු බොහෝ වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉතා කඩිනමින් ඉන්ධන පරීක්ෂාව සිදුකිරීමට කටයුතු කරමි. |
| (ඉ) | මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ 2015 ජූලි 14 දිනැති අංක 04/205 දරන චක්‍රලේඛයේ 02 වගන්තිය | රාජ්‍ය ආයතන සඳහා රක්ෂණාවරණයන් ලබාගැනීමේදී එම සේවාව සෘජුවම ලබාගැනීමට කටයුතු කළයුතු වුවද සභාව සතු වාහන 18 ක් සඳහා නියෝජිතයන් මාර්ගයෙන් රක්ෂණාවරණයන් ලබාගෙන තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අදාළ රක්ෂණ ආයතනයේ සෘජුවම රක්ෂණාවරණ ලබාගැනීමට කටයුතු කරමි. |
| (ඊ) | මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ 2013 අප්‍රේල් 11 දිනැති සීපීසී/ සීඑස්/06/06/02 චක්‍රලේඛයේ 04 වගන්තිය | සභාවේ සේවය කරන තනතුරු 08 කට අදාළ නිලධාරීන් 19 දෙනෙකු විසින් ඇප තැන්පත් කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | චක්‍රලේඛ ප්‍රකාරව ඇප මුදල් තැන්පත් කිරීමට කටයුතු කරමි. |

1.4.2 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කඳුරට සංවර්ධන බැංකුව පවත්වාගෙන යන ගොඩනැගිල්ලේ අලුත්වැඩියාවන් හා වරිපනම් ගෙවීම අයිතිකරු දැරීමේ පදනම මත මාසික රජයේ තක්සේරුව රු.70,000 ක් ලෙස දක්වා තිබුණද අයකරනු ලබන කුලිය රු.38,000 ක් වීම නිසා මාසිකව රු.32,000 ක පාඩුවක් සිදුවී තිබුණි. | තක්සේරුව මත කුලී අය කළ යුතු වේ. | ඉදිරියේදී තක්සේරු කුලිය අයකිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(1) වගන්තිය ප්‍රකාරව පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය රහිතව ගලේවෙල මහජන පුස්තකාලයේ පුස්තකාල සහයක III ශ්‍රේණිය තනතුරක් සඳහා 2018 අගෝස්තු 18 දින පත්කර වැටුප් හා දීමනා ලෙස මාසිකව රු.31,824 ක් බැගින් ගෙවා තිබුණි. | ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කළ යුතු වේ. | පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කරමි. |

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ අදායම රු.13,446,141 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,022,288 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
-----------------------

2.2..1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිග ආදායම්
------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තු ගත ආදායම | 2018 බිල්කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තු ගත ආදායම | 2017 බිල්කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 19,978,000 | 2,706,087 | 2,897,105 | 2,286,153 | 2,353,000 | 2,817,440 | 2,851,489 | 2,397,884 |
| කුලී | 4,950,000 | 3,298,552 | 3,338,304 | 643,608 | 16,600,000 | 4,188,262 | 4,249,292 | 615,930 |
| බලපත්‍ර ගාස්තු | 3,400,000 | 2,807,345 | 2,807,345 | - | 3,050,000 | 2,861,100 | 2,861,100 | - |
| වෙනත් ආදායම් | 1,170,000 | 1,625,110 | 1,625,110 | - | 1,145,000 | 1,222,402 | 1,205,502 | - |
| | 29,498,000 | 10,437,094 | 10,667,864 | 2,929,761 | 23,148,000 | 11,089,204 | 11,167,383 | 3,013,814 |

2.2.2 වරිපනම්
----------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිඟය හා වර්ෂයේ බිල්කිරීම රු.3,568,027 කින් වර්ෂය තුළ රු.1,926,735 ක මුදලක් ලැබී තිබුණි. | හිඟ මුදල් අයකර ගත යුතු වේ. | මෙම හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රාජ්‍ය ආයතන 06 කින් හිඟ වරිපනම් වශයෙන් රු.233,444 ක මුදලක් 2011 වර්ෂයට පෙර සිට අයවීමට තිබුණි. | බදු ගිවිසුමකට එළඹීම කළ යුතු වේ. | මෙම හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට අදාළ ආයතනවලට දැනුම්දී ඇති බව දන්වමි. |

2.2.3 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ පවතින සන්නිවේදන කුළුණු හඳුනාගෙන වාර්ෂික බලපත්‍ර ගාස්තු අයකරගැනීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | වාර්ෂික බලපත්‍ර ගාස්තු අයකර ගත යුතු වේ. | සන්නිවේදන කුළුණු ස්ථාපිත කිරීමේදී ගාස්තු අයකරන අතර වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අයනොකරන බව දන්වමි. |

2.2.4 ජල ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය ආරම්භයේ හිඟය සමඟ වර්ෂයේ බිල්කිරීම් රු.1,439,783 කින් වර්ෂය තුළදී 66% ක් හෙවත් රු.950,257 ක මුදලක් අයකරගෙන තිබුණි. | හිඟ මුදල් අයකර ගත යුතු වේ. | 2019 වර්ෂයේදී සියලුම හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

2.2.5 මස් කඩ කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර 02 ක පමණ කාලයක සිට ගලේවෙල ගවමස් කඩයෙන් රු.412,302 මුදලක් අයකර ගත යුතුව පැවතුණි. | අදාළ හිඟ මුදල් අයකර ගත යුතු වේ. | මෙම මුදල් වාරික වශයෙන් මේ වන විටත් අයවන බව දන්වා ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද එහි සංවර්ධන ව්‍යාපෘති මොනවාද යන්න සඳහන් කර හෝ එක් එක් ක්‍රියාකාරකම වෙනුවෙන් ඇස්තමේන්තුගත ප්‍රතිපාදන දක්වා නොතිබුණි. | සංවර්ධන ව්‍යාපෘති හා ඇස්තමේන්තුගත ප්‍රතිපාදන දැක්විය යුතු වේ. | ක්‍රියාකාරී සැලැස්ම සඳහා සංවර්ධන ව්‍යාපෘති ඇතුළත් නොකරන අතර වාර්ෂික සංවර්ධන සැලැස්ම සංවර්ධන ව්‍යාපෘති හා ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ඇතුළත් කරන බව දන්වමි. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳව සමාලෝචිත වර්ෂයේදී වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත්ද, නැද්ද යන්න පිළිබඳව විගණනයට තොරතුරු ඉදිරිපත් නොවිය. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟා වී ඇති බවට තොරතුරු ලබාදීම කළ යුතු වේ. | මේ සඳහා විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇති බව දන්වමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 2016 හා 2017 වර්ෂවල අනතුරට ලක්වී තිබුණු යන්ත්‍රෝපකරණ අනතුරට ලක්වී වර්ෂ 02 කට අධික කාලයක් ගත වුවද රක්ෂණ වන්දි ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | රක්ෂණ වන්දි ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් රක්ෂණ ආයතනය සමඟ සාකච්ඡා කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | මධ්‍යම පළාත් වාර්ෂික සංවර්ධන සැලැස්ම 2018 යටතේ සියඹලාගහවෙල ග්‍රාම නිලධාරී වසමේ ජල නළ එලීම හා අනෙකුත් සංවර්ධන කටයුතු සඳහා සභා අරමුදලින් වැය කළ රු.3,587,500 ක මුදල ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල ප්‍රතිපූර්ණය කර ගත යුතු වේ. | මුදල් ප්‍රතිපූර්ණය කරගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වා ඇත. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 08 ක් වෙනුවෙන් පුරප්පාඩු 18 ක් පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතු වේ. | පුරප්පාඩු සම්බන්ධයෙන් දැනුම්දී ඇති අතර කාර්යාලගත තනතුරු සඳහා බඳවා ගැනීමට අනුමැතියට ඉදිරිපත් කර ඇති බව දන්වමි. |

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු ප්‍රජාශාලා 118 ක්, සුසාන භූමි 82 ක්, පොදු ළිං 251 ක් හා පෙර පාසල් 02 ක් ලේඛනගත කර නොතිබුණි. | වත්කම් ලේඛනගත කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කරමි. |

3.4.2 නඩත්තු හා අලුත්වැඩියා සිදු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු බැකෝ යන්ත්‍රයක් හා මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයක් අනතුරට භාජනය වී වසර 02 කට අධික කාලයක් ගතවී තිබුණද අලුත්වැඩියා කර නොතිබුණි. | යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කළ යුතු වේ. | මෙම යන්ත්‍ර අලුත්වැඩියා කිරීමට කටයුතු කරමි. |

3.4.3 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වෑන් රථයක් වසර 02 ක්, අත්ට්‍රැක්ටරයක් වසර 09 ක් හා තණකොළ කපන යන්ත්‍රයක් වසර 02 ක් තිස්සේ නිශ්කාර්යව තිබුණි. | සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතු වේ. | මෙම වාහන වෙන්දේසි කිරීමට කටයුතු කරමි. |

3.5 ප්‍රසම්පාදනය

---------------

කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **වාසලකෝට්ටේ පුස්තකාල භූමියේ වැට ගැසීම** වාසලකෝට්ටේ පුස්තකාල භූමියේ වැට ගැසීම වෙනුවෙන් 2018 මාර්තු 22 දින වැට කණු 80 ක් රු.160,000 කට මිලදීගෙන තිබුණ ද 2018 නොවැම්බර් 09 දින වන විටත් වැට ඉදිකිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිකිරීම් කටයුතු සිදු කළ යුතු වේ. | අදාළ කටයුත්ත හැකි ඉක්මනින් අවසන් කරන බව දන්වමි. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

විගණන හා කළමනාකරණ කමිටු

---------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂිකව විගණන හා කළමනාකරණ කමිටු 04 ක් පැවැත්විය යුතු වුවත් 2018 වර්ෂය තුළ පවත්වා තිබුණේ කමිටු වාර 02 ක් පමණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | කමිටු පැවැත්වීම සඳහා සූදානම් කළද අදාළ නිලධාරින් කැඳවා ගැනීමේදී සිදුවූ අපහසුතාවයන් හේතුවෙන් චක්‍රලේඛ පරිදි කටයුතු කිරීමට නොහැකි වූ බව දන්වමි. |